
# අපූරු වළල්ල



දිහාසා මිහිනුලී සෙනෙවිරත්න

# අපූරු වළල්ල

දිහාසා මිහිනුලී සෙනෙවිරත්න

2023 නොවැම්බර්

සියලු හිමිකම් ඇවිරිණි

ප්‍රථම මුද්‍රණය
2023 නොවැම්බර්

ISBN 978-624-206-622-6

දිහාසා මිහිනුලී සෙනෙවිරත්න

7-F

මහාමායා බාලිකා විදුහල, මහනුවර

# පිදුම

මා ආදර දෙමාපියන්ට

සෙනෙහසින්....

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත්  බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින්  ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු  පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

 2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

 මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශම්කලා  සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

තරූ කියන්නේ ලස්සන පුංචි ගෑණු ළමයෙක්.

ඇයට තිබුනා අපූරු වළල්ලක්.

ඒ වළල්ල තරූ කියන ඕනෑම දෙයක් කරලා දෙනවා.

තරූ කැමති ගොඩාක් දේ, ඒ වළල්ල නිසා ඇයට ලැබුණා.

හිමිදිරියේ අවදි වෙලා මිදුලේ ඇවිදින එක තරූගේ පුරුද්දක්.

ඔන්න දවසක්දා තරූ මිදුලට ගියා.

අම්මගේ අලුත්ම රෝස පැළේ ලස්සන රතු රෝස මලක් පිපිලා.

තරූට අසාවක් ඇති වුණා, රෝස මල කඩන්න.ඒත් අම්මා බනියි. තරූට හිතුණා.

ඒ නිසා අපූරු වළල්ල අතේ තියාගෙන ලස්සන ගීයක් ගැයුවා.

“වළල්ල, වළල්ල අම්මගේ රෝස පැළේරෝස මල් ගොඩාක් පිපෙන්න.” තරූ ඒ ගීතය කිව්වා විතරයි රෝස මල් ගොඩාක් පිපුණා.

තරූ ඒවායින් එක මලක් කඩාගෙන නැටුමක් නැටුවා.

පස්සේ ඒ මල මේසේ උඩ මල් වාස් එකට දැම්මා.



තරූ හවස මිදුලට ගියා සෙල්ලම් කරන්න.

අල්ලපු ගෙදර ඉන්නපිරිමි ළමයි ටිකරොකට් හදලා ඒවා උඩ අරිනවා තරූ දැක්කා.

"වළල්ල, වළල්ල දිලිසෙන රොකට් එකක් මටත් හදලා දෙන්න." තරූ ගැයුවා.

එතකොටම දිලිසෙන රොකට් එකක් තරූට හම්බ වුණා.

තරූ ඒක අහසට පා කරා.



ඊට පස්සේ තරූ පාර දිගේ යන කොට දැක්කා ගැහැණු ළමයි ගොඩාක් බෝනික්කන් එක්ක සෙල්ලම් කරනවා.

තරූට හිතුණා එයාලට විහිළුවක් කරන්න.

“වළල්ල, වළල්ල ලෝකේ තියෙන ලස්සන බෝනික්කන් ඔක්කොම මට දෙන්න.” කිව්වා විතරයි බෝනික්කන්ගෙන් පාර පිරුණා.ළමයි බෝනික්කන්ගෙන් යට වෙන්න පටන් ගත්තා.

තරූ හොඳටම බය වුණා.දුවලා ගිහින් ළඟ තිබ්බ ගහකට නැග්ගා.හයියෙන් ගීයක් ගැයුවා.

“වළල්ල, වළල්ල බෝනික්කන් ඔක්කොම ආපහු යවන්න.”එතකොට ඒබෝනික්කෝ ටික ආපහු ගියා.

තරූට තේරුණා එයා වැරැද්දක් කළේ කියලා.

එයා බයෙන්, බයෙන් හෙමින්, හෙමින් වට පිට බල බල ගහෙන් බිමට බැස්සා.



එතකොට එතෙන්ටආපු ලොකු අක්කෙක් තරුට කිව්වා "බලන්න ඔයා කරපු දෙයින් මගේ නංගි, හිරූ අතුරුදහන් වෙලා.එයා කොහේ හරි අතරමං වෙලා ඇති.එයාව හොයලා දෙන්න මට" කියළා.

තරූ එයාගේ අපූරු වළල්ල අතට ගත්තා.ලස්සන ගීයක් ගැයුවා.

"වළල්ල,වළල්ල මගේ පුංචි වළල්ල නැති වුණ හිරූ ව අපිට ආපහු හොයලා දෙන්න."


එතකොටම හිරූ එතනට ආවා.



දැන් හැමෝටම හරි සතුටුයි.හැමෝම එකට එකතුවෙලා සතුටින් සෙල්ලම් කළා.

තරූ එදා හිතා ගත්තා ආයේ කාටවත් කරදර වෙන දේවල් කරන්න හොඳ නෑ කියලා.





පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01